**ගල්නෑව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 06 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 09 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**
**-------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ගල්නෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

**(අ).** සමාලෝචිත වර්ෂය තුල දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සභාව වෙත ලැබුණු ගැල්වනයිස් බට 264 ක වටිනාකම රු.292,286 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**(ආ).** සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආදායම රු.43,284,800ක් සහ ප්‍රාග්ධන වියදම රු.43,217,552 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**(ඇ).** සමාලෝචිත වර්ෂය තුළ පුස්තකාල වෙත ලැබුණු පොත් 300 ක වටිනාකම වූ රු.59,139 ක් ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ණයගැති ශේෂය රු.1,479,966 ක් සහ ණයහිමි ශේෂය රු.27,849,017 ක් දක්වා තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් අතිරික්තය රු.972,385 ක්වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ඌනතාවය රු.306,963 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i). | වරිපනම් හා බදු | 1,886 | 1,494 | 632 |
| (ii). | බදු කුලී | 1,835 | 1,568 | 442 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 901 | 835 | 111 |
| (iv). | වෙනත් ආදායම් | 1,627 | 454 | 1,173 |

**2.2.2 ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම**

--------------------------------------------

සමාලෝචිත වර්ෂය තුල සභා බල ප්‍රදේශය තුල ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා බලපත්‍ර ගාස්තු අයකිරීමට සභා තීරණයක් ගෙන රජයේ ගැසට් පත්‍රයේ පලකර නොතිබුණු නමුත් වර්ෂය තුල රු.196,025 ක දැන්වීම් පුවරු ගාස්තුවක් අයකර තිබුණි.

**2.2.3 කසල බදු**

-------------

දිර්ඝ කාලයක සිට ඉදිරියට එමින් පවතින රු.631,625 ක හිඟ කසල බදු 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 159 (2) වගන්තිය අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 කඩකුලී**

----------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය අනුව අයවිය යුතු කුලි රු.226,100 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.5 දුරකථන කුළුණු ගාස්තු**

--------------------------

සභා බලප්‍රදේශය තුල ස්ථාපිත කර තිබුණු දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 06 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/08 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්**

-------------------------------------------------------

වර්ෂ කිහිපයකට පෙර සභාව වෙත ලබාදී තිබුණු රු. 1,016,469 ක් වටිනාකමැති උපකරණ හා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය ප්‍රයෝජනයට නොගෙන දිරාපත් වෙමින් තිබුණි.

3.2 **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

-------------------------------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත 132 (ඒ) වගන්තිය ප්‍රකාරව පුද්ගලික ප්‍රදාන සඳහා දරන ලද එකතුව රු.68,487 ක්වූ වියදම් සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්ක්ෂමතා
------------------------------

(අ) දීර්ඝ කාලයකට පෙර සභාව වෙත ලැබී තිබුණු ටිපර් රථය හා බවුසරය (203 වන අධිකාරය) මෝටර් වාහන පනතේ 2 (1) වගන්තිය පරිදි ලියාපදිංචි නොකර ධාවනය කරමින් පැවතුණි.

(ආ) 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ගෙවිය යුතු කර්මාන්ත අතරුදවුම් සහ කොටස් ගෙවීම්වල එකතුව රු.1,849,698 ක් අදාල කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට කටයුතු නොකර සභාවේ රඳවාගෙන තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සභාව වෙත පවරා තිබුණු අක්කර 28.7 ක වපසරියකින් යුත් රු.4,472,000 ක වටිනාකමැති සුසාන භූමි 24 ක අයිතිය සම්බන්ධයෙන් 2006 නොවැම්බර් 14 දිනැති පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 09 හි යෝජනා හා නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3.4 හඳුනාගන්නා ලද පාඩු
-------------------------

2001 වර්ෂයේ ගල්නෑව සතිපොල බදු ගැණුම්කරු විසින් සභාවට ගෙවිය යුතු රු.116,640 ක් නොගෙවීම මත නඩු පවරා තිබූ නමුත් 2005 වර්ෂයේ සිට විත්තිකරු සොයාගත නොහැකි වීම නිසා රු.116,640 අයකර ගැනීමට නොහැකිව පවතී.

4. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ .

(අ) අභ්‍යන්තර පාලනය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) ගිණුම්කරණය.

(ඈ) ආදායම් පරිපාලනය.

(ඉ) වත්කම් කළමනාකරණය

(ඊ) මානව සම්පත් කළමනාකරණය